**ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම - 2018**

---

## 1.1 මතය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමෙහි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත්කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගම වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් හදුනා නොගැනීම මගින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරවු කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරවු කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනු දෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබුවේද යන බව;

- යම් අදාල ලිඛිත නීතියනට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව;
- සමාගමේ සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව ව කටයුතු කර ඇති බව;
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුල සහ අදාල නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව;

### 1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### 1.5.1 ලැබීම්

| විගණන ගැටළුව | කළමණාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගුවන් සේවා ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන කළමනාකරුවෙකු ලෙස සමාගම පත් කර තිබුණි.මේ සඳහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂය රු.246,939,587 කි. 2018 දෙසැම්බර් 31 දින වන විට මෙම ශේෂය මුදල් අමාත්‍යාංශය විසින් සනාථ කර නොමැති අතර විගණන දිනය දක්වා ඉහත හිඟ මුදල අය කර ගැනීමට සමාගමට නොහැකි වී තිබුණි. | ලැබිය යුතු මුදල් අය කර ගැනීම සඳහා සාකච්ඡා පවත්වමින් ඇත. | සමාගමට ලැබිය යුතු මුදල අය කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 35,500 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.362,786,903 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.362,751,403 ක හෙවත් සියයට 200 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වෙළඳපල පොලී අනුපාතවල අහිතකර චලනයන් අනුව යමින් සුරකුම්පත් වල මිල අඩුවීම හේතුවෙන් වෙළඳ කළඹට සිදුවී ඇති පාඩුව මෙම පිරිහීමට හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ උපනති විශ්ලේෂණය

ප්‍රධාන වශයෙන් ආයෝජන කළඹෙහි සාමාන්‍ය වටිනාකම සහ පොලී අනුපාත වැඩිවීම හේතුවෙන් පෙර වර්ෂය හා සැසඳීමේදී සමාගමේ පොලී ආදායම රු.මිලියන 250 කින් හෙවත් සියයට 25 කින් ඉහළ ගොස් තිබුණි. සමාගමේ ණය ගැනීම් කළඹේ වැඩිවීම හේතුවෙන් පොලී වියදමද රු. මිලියන 179 කින් හෙවත් සියයට 25 කින් වැඩිවී තිබුණි. වෙන්දේසියට සහභාගිවන්නන්ගේ සාර්ථක ලංසු ප්‍රමාණය පහත වැටීම හේතුවෙන් 2018 දී ගාස්තු ආදායම රු.මිලියන 18 කින් හෙවත් සියයට 27 කින් අඩු වී තිබුණි .

වෙළඳපල පොලී අනුපාතවල අහිතකර චලනයන් හේතුවෙන් 2017 දී රු. මිලියන 314 ක වෙළඳ ලාභය 2018 දී රු. මිලියන 355 ක වෙළඳ අලාභයක් බවට පරිවර්තනය වී තිබුණි. 2018 වර්ෂය තුළ වැටුප් හා ප්‍රසාද දීමනා වැඩිවීම හේතුවෙන් පුද්ගලික පිරිවැය ද රු.මිලියන 8 කින් ඉහළ ගොස් තිබුණි

## 2.3 අනුපාත විශ්ලේෂණය

ආංශික අනුපාත හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ තෝරාගත් වැදගත් ගිණුම්කරණ අනුපාතයන් පිළිබඳව පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) සමාගමේ අවදානම් බරිත ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය ආංශික අනුපාතයට වඩා ඉහළ අගයක් ගන්නා අතර එය 2017 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව සියයට 13.6 කින් ඉහළ ගොස් තිබුණි.

(ii) සමාගමේ සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී පිළිවෙලින් සියයට 4.98 කින් සහ සියයට 19.9 කින් අඩු වී තිබුණි.

(iii) 2017 වර්ෂයේදී රු. මිලියන 1,945 ක්ව පැවති සමාගමේ මූලික ප්‍රාග්ධනය 2018 වර්ෂයේදී රු. මිලියන 2,723 දක්වා සියයට 40 කින් ඉහළ ගොස් තිබුණි. එය අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවය වන රු. මිලියන 1,000 ට වඩා ඉහළ අගයකි. සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 800 ක නව කොටස් නිකුතුව හේතුවෙන් මූලික ප්‍රාග්ධනය ඉහළ ගොස් තිබුණි.

## 3. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 ආයතනික සැලැස්ම

| විගණන ගැටලු | කළමණාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන පොදු ව්‍යාපාර ව්‍යවසාය චක්‍රලේඛයෙහි 5 වන පරිච්ඡේදය ප්‍රකාර සමාගම විසින් 2018 වර්ෂය සඳහා ආයතනික සැලැස්මක් හෝ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2019-2021 සඳහා ආයතනික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත. | අදාළ විධානය සමඟ අනුකූල වීම සහතික කළ යුතුය. |